**රුහුණ විශ්වවිද්‍යාලය - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය**
**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග - 2020 (ප්‍රථමවර) පරීක්ෂණයට**
**පෙනී සිටින සිසුන් සඳහා අයදුම්පත් කැඳවීම.**

1. රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් ඉහත සඳහන් පරීක්ෂණය සඳහා 18 වන ශිෂ්‍ය කණ්ඩායමෙහි සුදුසුකම් ලත් අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.01.29** දින බැවින්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදින හෝ ඊට පෙර ලැබෙන සේ "සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම හා අධ්‍යයන වර්ෂය සඳහන් කළ යුතු ය.

3. පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති අපේක්ෂකයන් විසින් හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ එවනු ලබන සියලුම අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

4. පරීක්ෂණයට පෙනී සිටින විෂයයන්, පත්‍ර නාමය හා පත්‍ර සංකේතය අයදුම්පතෙහි සටහන් කරන්න.

5. **පරීක්ෂණ ගාස්තු ගෙවීම.**

   ඔබ විසින් බාගත කරනු ලබන වවුචර් පතෙහි කොටස් 03 ම සම්පූර්ණ කර මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් රුහුණ විශ්වවිද්‍යාලයේ රැස් කිරීමේ ගිණුමට වවුචර්පතෙහි ඇති යොමු අංකය හරහා විභාග ගාස්තු ගෙවීම සිදු කොට එහි කාර්යාලයීය පිටපත (office copy) අයදුම්පත්‍රය සමඟ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට ලැබීමට සලස්වන්න. (මුදල් වවුචර්පත බාගත කර ගැනීමේදී ගෙවීම් කාණ්ඩය ලෙස "විභාග ගාස්තු " තෝරා ගත යුතුය.

6. **විභාග ප්‍රවේශ පත්‍ර අන්තර්ජාලය (www.dceu.ruh.ac.lk) මගින් බාගත (Download) කර හැකි අතර, තැපැල් මගින් නිකුත් කරනු නොලැබේ.**

7. විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත්කර ඒ සඳහා පෙනී නොසිටින සිසුන් අදාල වෛද්‍ය සහතිකය, විභාග ප්‍රවේශ පත්‍රය හා වෛද්‍ය සහතික අයදුම්පත්‍රය අදාල විෂය අවසන්ව දින 7 ක් ඇතුලත ඉදිරිපත් කල යුතුය.

**නියමිත විභාග ගාස්තු**
ප්‍රථමවර පෙනීසිටිම සඳහා රු. 4000

**සැලකිය යුතුයි** :-ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග - 2020 පරීක්ෂණයට පෙනී සිටීම සඳහා බාහිර විභාග අතුරු ව්‍යවස්ථාව අනුව ඔබ සුදුසුකම් සපුරන්නේ නම් පමණක් අදාළ අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. සාවද්‍ය තොරතුරු සහිත අයදුම්පත්‍ර සඳහා ගාස්තු ආපසු ගෙවීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය,
රුහුණ විශ්වවිද්‍යාලය.